# ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ නිලධාරී කණ්ඩායම ශ්‍රී ලංකා සංචාරය නිමා කරයි

2024 අගෝස්තු 02

යම් රටක සංචාරයකින් පසු හඳුනා ගන්නා ලද මූලික සොයාගැනීම් පිළිබඳව ජා.මූ. අරමුදලේ කාර්යමණ්ඩල කණ්ඩායම්වල ප්‍රකාශ එම දූත මෙහෙය අවසානයේ නිකුත් කරන මාධ්‍ය නිවේදනයන්හි ඇතුළත් වේ. මෙම ප්‍රකාශයේ අන්තර්ගත අදහස් ජා.මූ. අරමුදලේ කාර්යමණ්ඩලයේ වන අතර එමගින් ජා.මූ. අරමුදලේ විධායක මණ්ඩලයේ අදහස් අවශ්‍යයෙන් ම නියෝජනය නොවේ. මෙම දූත මෙහෙය ජා.මූ. අරමුදලේ විධායක මණ්ඩලයේ සාකච්ඡාවකට ලක් නොවේ.

- *ශ්‍රී ලංකා බලධාරීන් විසින් ක්‍රියාවට නංවන ලද ආර්ථික ප්‍රතිසංස්කරණ, අඛණ්ඩව කාර්තු තුනක මූර්ත දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය, අඩු උද්ධමනය, රාජ්‍ය ආදායම් රැස් කිරීම ඉහළ යාම සහ විදේශීය සංචිත ගොඩ නැගීම සමඟින් ආර්ථිකය යථා තත්ත්වයට පත් කිරීමට අඛණ්ඩව සහාය වී ඇත.*

- *ශ්‍රී ලංකාවේ සියලුම ජනතාවට ප්‍රතිලාභ සැලසෙන ලෙස පුළුල් පදනමක් සහිතව සහ ස්ථාවරව ආර්ථිකය යථා තත්ත්වයට පත් වීම සහතික කිරීම සඳහා ප්‍රතිසංස්කරණ න්‍යාය පත්‍රයට අනුකූලව තීරණාත්මක ප්‍රගතියක් ඇති වීම අවශ්‍ය වේ.*

- *ජා.මූ. අරමුදලේ සහාය ලබන වැඩසටහන යටතේ ඇති ප්‍රධාන වගකීම් සපුරාලීමේ ප්‍රගතිය, විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහනේ තුන්වන සමාලෝචනය තුළින් විධිමත් ලෙස තක්සේරු කෙරෙනු ඇත.*

**කොළඹ, ශ්‍රී ලංකාව - 2024 අගෝස්තු 2:** මෑත කාලීන සාර්ව ආර්ථික ප්‍රවණතා සහ ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකමේ සහාය සහිතව ක්‍රියාත්මක කෙරෙන, බලධාරීන්ගේ ආර්ථික ප්‍රතිසංස්කරණ වැඩසටහන යටතේ ආර්ථික හා මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීමේ ප්‍රගතිය සාකච්ඡා කිරීම සඳහා ජ්‍යෙෂ්ඨ දූත මණ්ඩල ප්‍රධානී පීටර් බෲවර් මහතාගේ නායකත්වයෙන් යුත් ජා.මූ. අරමුදලේ දූත කණ්ඩායමක් 2024 ජූලි 25 සිට අගෝස්තු 2 දක්වා ශ්‍රී ලංකාවේ සංචාරයක යෙදුණි.

දූත මෙහෙය අවසානයේ දී බෲවර් මහතා පහත ප්‍රකාශය නිකුත් කළේය:

“ශ්‍රී ලංකා බලධාරීන් විසින් ක්‍රියාත්මක කරන ලද ආර්ථික ප්‍රතිසංස්කරණ වැඩසටහන ප්‍රශංසනීය ප්‍රතිඵල ලබා දෙමින් පවතියි. මූර්ත දළ දේශීය නිෂ්පාදිතය අඛණ්ඩව කාර්තු තුනක් වර්ධනය වෙමින් 2024 වසරේ පළමු කාර්තුවේ දී වර්ධනය වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 5.3ක් දක්වා ඉහළ යාමත් සමඟ ආර්ථිකය යථා තත්ත්වයට පත් වීම අඛණ්ඩව සිදු වේ. උද්ධමනය, ශ්‍රී ලංකා මහ බැංකුවේ සියයට 5 ඉලක්කයට වඩා අඩු මට්ටමක පාලනය වී පවතින අතර, දේශීය ණය පොලී අනුපාතික ද අඩුවී ඇත. 2024 වසරේ පළමු භාගය තුළ දී දළ විදේශීය සංචිත එ.ජ. ඩොලර් බිලියන 1.2කින් වැඩි වී එ.ජ. ඩොලර් බිලියන

5.6ක් දක්වා ළඟා විය. එම කාලසීමාව තුළ රාජ්‍ය ආදායම වැඩිදියුණු විය. ඉදිරියේ දී මෙම ප්‍රගමනයන් ශ්‍රී ලංකාවේ සියලුම ජනතාවට වඩා හොඳ ජීවන තත්ත්වයන් බවට පරිවර්තනය වීම අවශ්‍ය වේ.

"ශ්‍රී ලංකාව, මෙම තීරණාත්මක සන්ධිස්ථානයේ දී, අභියෝග සහිතව නැවත යථා තත්ත්වයට පත් වී සිටින මෙම අවස්ථාවේ දී ප්‍රතිසංස්කරණයන්හි ගම්‍යතාව පවත්වා ගැනීම සහ වැඩසටහන යටතේ වන සියලුම වගකීම් නියමිත කාලයට ක්‍රියාත්මක කිරීම සහතික කිරීම, අද දක්වා අත් පත් කරගත් දුෂ්කර ආර්ථික ප්‍රගතිය වඩා තහවුරු කිරීමට සහ ආර්ථිකය ස්ථාවර පදනමක් මතට ගෙන ඒමට ඉතා වැදගත් වේ. සාර්ව ආර්ථික ස්ථාවරත්වය පවත්වා ගැනීම සහ ණය තිරසාරභාවය යථා තත්ත්වයට පත් කිරීම සඳහා රාජ්‍ය ආදායම ඉහළ නැංවීම පිණිස තවදුරටත් ප්‍රයත්න දැරීම අවශ්‍ය වේ. ශ්‍රී ලංකාවේ ණය තිරසාරභාවය ප්‍රතිස්ථාපනය කිරීමට අවශ්‍ය ප්‍රධාන සාධකයක් වන මැදි කාලීනව දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 2.3ක ප්‍රාථමික ශේෂයක් පවත්වා ගැනීමේ අරමුණ කරා ළඟා වීම සඳහා 2025 අයවැය, සුදුසු ආදායම් ක්‍රියාමාර්ග සහ අඛණ්ඩ වියදම් සීමා කිරීම මත පදනම් විය යුතුය. මෝටර් රථ ආනයන මත පනවා ඇති සීමා ලිහිල් කිරීම, 2025 වසරේ දී රාජ්‍ය ආදායම් ඉහළ නැංවීම සඳහා සහාය වනු ඇත. 2025 වසරේ අප්‍රේල් වන විට අපනයනකරුවන් සඳහා නිසි ලෙස ක්‍රියාත්මක වන එකතු කළ අගය මත බදු ආපසු ගෙවීමේ ක්‍රමයක් ස්ථාපිත කිරීම ඇතුළු බදු පරිපාලන ප්‍රතිසංස්කරණ මගින්, බදු අනුකූලතාව තවදුරටත් වැඩිදියුණු කළ හැකිය. යෝජිත ඕනෑම ක්‍රියාමාර්ගයක් නිසා රාජ්‍ය මූල්‍ය තත්ත්වය දුර්වල වේ නම් එහි බලපෑම අවම කිරීම සඳහා වඩාත් උසස් තත්ත්වයේ හානිපූර්ණ ක්‍රියාමාර්ග ගත යුතුය. නව බදු නිදහස් කිරීම් වළක්වාගැනීම මගින් දූෂණ අවදානම් සහ රාජ්‍ය ආදායම් අහිමි වීම් අවම වන අතරම, වඩා හොඳින් පුරෝකථනය කළ හැකි සහ විනිවිදභාවයකින් යුතු බදු ක්‍රමයක් සහතික කෙරේ. ඉදිරියේ දී ඇතිවිය හැකි රාජ්‍ය මූල්‍ය පිරිවැය මගහරවා ගැනීම සඳහා පිරිවැය ආවරණය කළ හැකි මට්ටම්වල බලශක්ති මිල අඛණ්ඩව පවත්වා ගැනීම ඉතා වැදගත් වේ. ඉලක්කකරණය වැඩි දියුණු කිරීම සහ මුදල් සංක්‍රාම ලැබෙන ජනගහනයේ ආවරණය වඩාත් පුළුල් කිරීම තුළින් දිළිඳු සහ අවදානමට ලක්වූවන් ආරක්ෂා කිරීම ඉතා වැදගත් වේ. ප්‍රතිපත්ති නිසි ලෙස ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් ආර්ථිකය නැවත යථා ත්ත්ත්වයට පත් වීම අවදානමට ලක් විය හැකිය.

"රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත සහ රාජ්‍ය ණය කළමනාකරණ පනත යන ප්‍රධාන නීති දෙක සඳහා මෑත දී පාර්ලිමේන්තුව විසින් අනුමැතිය ලබා දීම, රාජ්‍ය මූල්‍ය විනය හා විචක්ෂණශීලී ණය කළමනාකරණය වැඩිදියුණු කරන සහ විනිවිදභාවය හා වගවීම ශක්තිමත් කරන සන්ධිස්ථානයක් වේ. පුළුල් ණය කළමනාකරණ උපාය මාර්ගයක් නිර්මාණය කිරීම සහ මනාව ව්‍යුහගත වූ හා ඒකාබද්ධ වූ රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලයක් පිහිටුවීම රජයේ මූල්‍ය අවදානම් අවම කිරීමට උපකාරී වේ.

"උද්ධමනය හොඳින් පාලනය වී ඇත. මුදල් ප්‍රතිපත්තිය විචක්ෂණශීලී විය යුතු අතර, උද්ධමන අපේක්ෂා කළමනාකරණය කිරීමට ප්‍රමුඛත්වය ලබා දිය යුතුය. මිල ස්ථායීතාව පවත්වා ගැනීම, ශ්‍රී ලංකා මහ බැංකුවේ ස්වාධීනත්වය ආරක්ෂා කිරීම මත ද රඳා පවතී. අඛණ්ඩව සංචිත ගොඩනැගීම සහ විනිමය අනුපාතිකයේ නම්‍යශීලීභාවය පවත්වා ගැනීම ප්‍රධාන ප්‍රමුඛතා ලෙස පවතී.

"බැංකු පනතේ මෑත කාලීන සංශෝධන සහ ඒවා ක්‍රියාත්මක කිරීමට අදාළ රෙගුලාසි මූල්‍ය පද්ධති ස්ථායීතාව ආරක්ෂා කිරීමට උපකාරී වනු ඇත. ආර්ථික වර්ධනයට දායක වීම සඳහා මූල්‍ය අංශයට අවකාශ සැලසීමට බැංකු අංශය ප්‍රමාණවත් ලෙස ප්‍රාග්ධනීකරණය කර ඇති බවට බලධාරීන් විසින් සහතික කළ යුතුය.

"බලධාරීන්ගේ මීට පෙර පැවති පාලන ක්‍රියාකාරී සැලැස්ම මත ගොඩනැගුණු, මෑතක දී සකස් කරන ලද දූෂණ විරෝධී ජාතික න්‍යාය පත්‍රය සාධනීය පියවරකි. විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහන යටතේ ඇති කෙටි කාලීන වගකීම්වලට ප්‍රමුඛත්වය ලබා දෙමින් පාලන නිර්ණ වාර්තාවේ දක්වා ඇති පාලන ප්‍රතිසංස්කරණ ස්ථිරව ක්‍රියාත්මක කිරීම, දූෂණ අවදානම් සඳහා විසඳුම් ලබා දීමටත්, පෙර ගන්නා ලද වැරදි ප්‍රතිපත්තිමය පියවර වළක්වා ගැනීම ප්‍රවර්ධනය කිරීමටත් ඉතා වැදගත් වේ. මහජන විශ්වාසය තහවුරු කිරීමට සහ මෙම වැදගත් ප්‍රයත්න ක්‍රියාත්මක කිරීම සඳහා පහසුකම් සැලසීමට යහපත් රාජ්‍ය පාලන ප්‍රතිසංස්කරණ සඳහා හිතකර පරිසරයක් සහතික කිරීම අවශ්‍ය වේ.

"ණය තිරසාරභාවය ඇති කිරීමේ මාවතට යොමු වීම සම්බන්ධයෙන් බලධාරීන් ප්‍රශංසනීය ප්‍රගතියක් ලබා ගෙන ඇත. දේශීය ණය ප්‍රතිව්‍යුහගත කිරීම ක්‍රියාත්මක කිරීම සහ නිල ණය හිමියන්ගේ කමිටුව හා චීන ආනයන අපනයන (China EXIM) බැංකුව සමඟ ගිවිසුම්වලට එළඹීම අවසන් කිරීම ප්‍රධාන සන්ධිස්ථාන වේ. සීමිත සහභාගීත්වයක් සහිතව බැඳුම්කර හිමියන්ගේ කමිටුව සමඟ පැවැත්වූ දෙවන වටයේ සාකච්ඡා අවසානයේ ප්‍රකාශයට පත් කරන ලද "ඒකාබද්ධ කාර්ය රාමුව" ජා.මූ. අරමුදලේ නිලධාරී කණ්ඩායම විසින් තක්සේරු කරන ලද අතර, මෙම තක්සේරුව බලධාරීන්ට සහ ඔවුන්ගේ ඉල්ලීම මත බැඳුම්කර හිමියන්ගේ මූල්‍ය උපදේශකයින්ට ලබා දී ඇත. ණය තිරසාරභාවය ළඟා කර ගැනීමට සහ ආයෝජකයින්ගේ විශ්වාසය යළි ලබා ගැනීමට අවශ්‍ය ඉතිරි පියවර කඩිනමින් අවසන් කර ගැනීම සඳහා අපි දිරිමත් කරමු. ශ්‍රී ලංකාවේ මේ වන විට ක්‍රියාත්මක වන ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ප්‍රයත්නයන් සඳහා අපි අඛණ්ඩව සහාය දෙන්නෙමු.

"ජා.මූ. අරමුදලේ සහාය ලබන වැඩසටහන යටතේ ඇති ප්‍රධාන වගකීම් සපුරාලීමේ ප්‍රගතිය විස්තීර්ණ ණය පහසුකමෙහි තෙවන සමාලෝචනයේ දී විධිමත් ලෙස තක්සේරු කරනු ලැබේ. තෙවන සමාලෝචනය සිදු කරන කාලසීමාව පසුගිය දා ප්‍රකාශයට පත් කරන ලද ජනාධිපතිවරණයෙන් පසුව රජය සමඟ සාකච්ඡා කරනු ලැබේ.

"ජනාධිපති සහ මුදල් අමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතා, ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති ආචාර්ය පී. නන්දලාල් වීරසිංහ මහතා, භාණ්ඩාගාර ලේකම් කේ.එම්. මහින්ද සිරිවර්ධන මහතා, සහ රජයේ හා ශ්‍රී ලංකා මහ බැංකුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සමඟ ජා.මූ. අරමුදලේ කණ්ඩායම සාකච්ඡා පැවැත්වීය. ජා.මූ. අරමුදලේ කණ්ඩායම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්, පෞද්ගලික අංශයේ නියෝජිතයින්, සිවිල් සමාජ සංවිධාන සහ සංවර්ධන හවුල්කරුවන් ද හමුවිය.

"දූත මෙහෙය අතරතුර ලබාදුන් විශිෂ්ට සහයෝගය වෙනුවෙන් බලධාරීන්ට ස්තුතිවන්ත වන අතර, පූර්ණ සහ සැමට ප්‍රතිලාභ සැලසෙන පරිදි ආර්ථිකය යථා තත්ත්වයට පත්කර ගැනීම සඳහා ශ්‍රී ලංකාවට සහාය වීමට අපගේ ඇති කැපවීම නැවත තහවුරු කිරීමට අපි කැමැත්තෙමු."